# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment


| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/05/MF/02/01 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2025.06.12 |
|---|---|---|---|---|---|

දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල් /දිස්ත්‍රික් ලේකම්
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
........................................

**<u>සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය එක්ව විගමණික ශ්‍රමිකයන් සඳහා 2013 වසරේ ක්‍රියාත්මක කරණු ලැබූ රටවිරු නිවාස ණය වැඩසටහන</u>**

ඉහත ණය වැඩසටහන යටතේ සමෘද්ධි ප්‍රජාමූල බැංකු විසින් තම අරමුදල් යොදාගෙන විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් නිර්දේශ කර ඉදිරිපත් කරන ලද විගමණික ශ්‍රමිකයන්ගේ අයදුම් පත් සඳහා ණය නිකුත් කර ඇත.

02. මෙසේ සමෘද්ධි බැංකු විසින් නිකුත් කරණ ලද රටවිරු නිවාස ණය බහුතරයක් අයකර අවසන් වුවද ඇමුනුම අංක 1 හි සඳහන් අක්‍රීය ණය තවදුරටත් අයකර ගැනීමට ඇත.

03. 2025.05. 27 දින රැස්වූ පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර කාරක සභාවේද මෙම ණය යෝජනා ක්‍රමය සම්බන්ධව විමසීම් කර ඇත.

04. මේ සම්බන්ධව 2025.06.04 දින ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමේදී මෙම ගැටළුව විසඳීම සඳහා පහත සඳහන් තීරණ ගනු ලැබීය.

4.1. ඔබ දිස්ත්‍රික්කයේ අක්‍රීය රටවිරු නිවාස ණය කරුවන් පිළිබඳ තොරතුරු ඒකරාශී කර, ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් පහත විස්තර සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත කණ්ඩායමක් පත්කර 2025.06.16 දින සිට 2025.07.15 වන දින දක්වා මසක කාලයක් තුල ගෙයින් ගෙට ගොස් රටවිරු ණය අයකර ගැනිමේ විශේෂ ජංගම සේවාවක් සංවිධානය කිරීම.

4.1.1. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ හෝ දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයේ සමෘද්ධි කලමණාකරු. (බැංකු /ප්‍රජාමූල/සමාජ සංවර්ධන/අධීක්ෂණ විෂයන් භාර )

4.1.2.සමෘද්ධි බැංකු සමිති කළමණාකරු / ව්‍යාපෘති කළමණාකරු

4.1.3. ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්ත කර ඇති විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ විෂයභාර නිලධාරි.

4.1.4. අදාල සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ කළමණාකරු / ක්ෂුද්‍ර මූල්‍ය විෂය භාර සංවර්ධන නිලධාරි / කලාප සහකාර.

4.1.5. අදාල ග්‍රාම නිලධාරි / වසමේ සමෘද්ධි සංවර්ධන නිලධාරි

4.1.6. අදාල ප්‍රජාමූල සංවිධානයේ සභාපති /ලේකම්

4.2. ඒ අනුව මෙම කණ්ඩායම සමෘද්ධි ප්‍රජාමූල බැංකු මට්ටමින් අක්‍රීය රටවිරු නිවාස ණය හිමියන්ගේ නිවෙස් වලට ගොස් ඔවුන් සමග සුහදව සාකච්ඡාකොට ගෙවිය හැකි ණය මුදල හා ගෙවීමේ කාලය පිළිබඳ ගිවිස්නාවකට එළඹීම.


1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරි<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி)<br>Director (Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |
| | | Hot Line :0112-889007 | | | |


c:\users\user\desktop\email - නව සමෘද්ධි ව_යවසාය වක්_රලේඛය නව 2025.05.16 (1)

4.3. ඒ අනුව අක්‍රීය ණය අයකර ගැනිමේ ක්‍රියාකාරී සැලැස්මක් ( Action Plan) වසම් මට්ටමින්, සමෘද්ධි ප්‍රජාමූල බැංකු, බැංකු සමිති හා දිස්ත්‍රික් මට්ටමින් සකස් කිරීම.

4.4. මෙම රටවිරු නිවාස ණය අයකරගැනීමේ දිස්ත්‍රික් සැලැස්ම 2025.07.21 හෝ ඊට ප්‍රථම ප්‍රධාන කාර්යාලයේ ක්ෂුද්‍ර මූල්‍ය අංශයට යොමුකර, ගිවිස්නාව අනුව අක්‍රීය ණය වාරික මුදල් අයකරගැනීමේ වගකීම වසම භාර සමෘද්ධි සංවර්ධන නිලධාරි වෙත පැවරීම.

05. ඉහත තීරණ අනුව ඔබ දිස්ත්‍රික්කයේ අයවීමට ඇති රටවිරු නිවාස ණය අයකර ගැනීමට හා එහි ප්‍රගතිය සොයා බැලීමට ඔබතුමාගේ විශේෂ අවධානය යොමුකරන මෙන් කාරුනිකව ඉල්ලමි.

06. මේ වෙනුවෙන් දක්වනු ලබන සහය ඉතා අගේකොට සලකමි.

සී.ඩී. කළුආරච්චි,
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

| | |
|---|---|
| 01.ලේකම්, ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය | - කා.දැ.ගැ.පි. |
| 02.සාමාන්‍යාධිකාරි, විදේශ සේවා නියුක්ති කාර්යාංශය | - ප්‍රාදේශීය විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිලධාරින්ගේ සහය ලබාදීම පිණිස. |
| 03. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, | - අ.ක.ස. |
| 04. සියළුම ප්‍රාදේශීය ලේකම් වරු. | - කා.දැ.ගැ.ස. හා අ.ක.ස. |